2016 . 04 . 27

# අ.පො.ස (උසස් පෙළ) විභාගය
# ද මැසනොද් විදුහල,කඳාන
# දේශපාලන විද්‍යාව

Learning Resource Center
R
De Mazenod College
Kandana

**12 ශ්‍රේණිය** **කාලය පැය 2**

සැලකිය යුතුයි

* මෙම කොටසේ අංක **(01) – 50)** දක්වා බහුවරණ ප්‍රශ්න 50 ක් ඇත. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයිය යුතුයි. එක් නිවැරදි පිළිතුරකට ලකුණු දෙක බැගින් හිමිවේ.

* අංක **(01)** සිට **(10)** තෙක් ඇති ඒ ඒ ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ අතරින් ප්‍රශ්නයේ මාතෘකාවට අදල වන පිළිතුර තෝරන්න.

(01) දේශපාලන විද්‍යාව හැඳින්වීමේදී අදල නොවන්නේ,
1. සමාජ විද්‍යාවක් වශයෙන් හැඳින්විය හැක
2. සමාජ විද්‍යාවන් අතරින් පැරණිම සමාජ විද්‍යාව ලෙස සැලකේ
3. ග්‍රීක යුගයේදී විධිමත් ලෙස අධ්‍යයනය කිරීම ඇරඹුණි
4. ඥාන ගවේෂණ විද්‍යාවන් සමග කිට්ටුවෙන් බැඳී ඇත
5. රාජ්‍ය පිළිබඳව හදරනු ලබන විද්‍යාවක් වේ (..........)

(02) දේශපාලනය අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ,
1. ආණ්ඩුව හා එහි වැඩ කටයුතු දැන ගැනීමට
2. අයිතිවාසිකම් හා යුතුකම් දැන ගැනීමට
3. දේශපාලන කරුණු පිළිබඳව අවබෝධය වැඩි දියුණු කර ගැනීමට
4. ජාතික හා ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට
5. නිරීක්ෂණ, නිගමන මත නිරවද්‍යතාව සහතික කිරීමට (..........)

(03) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය හා අදල වන්නේ,
1. ගැටුම් ප්‍රභවය, කළමනාකරණය හා නිරාකරණය
2. අන්තර් ජාතික වෙළඳ සමාගම්
3. දේශපාලන න්‍යාය හා දේශපාලන මතවාද
4. දේශපාලන ආයතන
5. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය (..........)

• **දේශපාලන විද්‍යාව හැදෑරීමට යොදගන්නා අධ්‍යයන ක්‍රමවලට අදල ලක්ෂණ කිහිපයක් පහත දක්වේ. ඒ අනුව ප්‍රශ්න අංක (04), (05) හා (06) ට පිළිතුරු සපයන්න.**

1. ආයතන සහ සංකල්ප සම්භවය හා විකාශනය තුළින් දේශපාලනය අධ්‍යයනය කරයි.
2. ඇත්ත වශයෙන්ම සිදුවන දේ නොව, විය යුතු දේ දෙස බලා දේශපාලනය අධ්‍යයනය කරයි
3. වෙනස් දේශපාලන ක්‍රම සංසන්දනය කිරීම තුළින් දේශපාලනය උගනියි
4. දේශපාලනයේ සමාජ පදනම ඉගෙනීම තුළින් දේශපාලනය තේරුම් ගනියි
5. මිනිස් හැසිරීම කේන්ද්‍ර කරගෙන දේශපාලනය අධ්‍යයනය කරයි

(04) ඓතිහාසික අධ්‍යයන මාර්ගයට අදල ප්‍රකාශය හඳුන්වන්න. (..........)

(05) සමාජ විද්‍යාත්මක අධ්‍යයන මාර්ගයට අදල ප්‍රකාශය හඳුන්වන්න. (..........)

(06) දර්ශනික අධ්‍යයන ක්‍රමයට අදල ප්‍රකාශය හඳුන්වන්න. (..........)

(07) ජාතික රාජ්‍යයක් නැගී ඒම කෙරෙහි දයක වූ සාධක වලට අයත් නොවන ප්‍රකාශය කුමක්ද?
1. ධනවාදයේ වර්ධනය
2. ෆැසිස්ට්වාදයේ නැගී ඒම
3. ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ වාදයේ නැගී ඒම
4. වැඩවසම් ක්‍රමයේ බිඳ වැටීම
5. කාර්මික විප්ලවය (……….)

(08) මිනිසුන් විසින් රාජ්‍ය පිහිටුවා ගනු ලැබූ හේතු හා නොගැලපෙන්නේ,
1. පොදු යහපත ගොඩ ගැනීම උදෙසා ය
2. නීතිය හා සාමය පවත්වා ගෙන යාම උදෙසා ය
3. විශ්ව සමාජයක් නිර්මාණය කිරීම උදෙසා ය
4. ජාතික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම උදෙසා ය
5. සමාජ අභිවෘද්ධිය ඇතිකර ගැනීම සඳහාය (……….)

(09) නව රාජ්‍යයන්හි පොදු ලක්ෂණ හා අදල නොවන්නේ
1. ආර්ථික වශයෙන් අසංවර්ධිත වීම
2. සමාජීය වශයෙන් බහුවිධ ස්වරූපයක් ගැනීම
3. දේශපාලන වශයෙන් නවීකරණය වීම
4. ජාතිය ගොඩනැංවීම පිළිබඳ ගැටලු වලට මුහුණපා සිටීම
5. දෙවන ලෝක යුද්ධයෙන් පසු යටත් විජිත භාවයෙන් නිදහස ලැබූ රටවල් වීම (……….)

(10) රාජයය සතු අත්‍යාවශ්‍ය ලක්ෂණ අතරට ඇතුලත් නොවන්නේ
1. නිශ්චිත භූමිය 2. ජනගහනය 3. ස්වාධිපත්‍ය බලය
4. රාජ්‍ය ඒකාධිකාරිත්වය 5. ආණ්ඩුව (……….)

**අංක (11) – (18) දක්වා ප්‍රශ්න සඳහා ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශ අතරින් නිරවද්‍ය වන්නේ ප්‍රකාශ හතරක් පමණි. එම ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

(11) සමාජය
A යම්කිසි භූමි ප්‍රදේශයක වාසය කරන මිනිසුන්ගේ එකතුවකි
B සමූහගතවී ජීවත් වීමට මිනිසුන් තුල ඇති කැමැත්ත ප්‍රතිඵලයකි
C සියලු දෙනාගේම පොදු ආශාවන් පිළිඹිබු කරයි
D රාජ්‍යයට පෙර බිහිවූවක් වේ
E රාජ්‍යයට වඩා උසස් වේ
1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (……….)

(12) ආණ්ඩුව
A රාජ්‍යයේ භාරකරුවා ලෙස සැලකේ
B රාජ්‍යයේ පදනම් සාධක අතරින් එකක් වේ
C රාජ්‍යයේ දේශපාලන හස්තය වේ
D රාජ්‍යයේ කැමැත්ත ක්‍රියාවට නංවන්නා වේ
E රාජ්‍යයේ මෙන් සමාජිකත්වය අනිවාර්ය නොවේ
1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (……….)

(13) සමාජයේ පවත්නා අනෙකුත් සමාජ සංවිධාන

A සමාගම් විශේෂ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටියි
B සමාගම් පනවන නීතිරීති වලට විශ්වීය වලංගු තාවයක් නැත
C රාජ්‍යයට යටත්ව ක්‍රියාවට නැංවේ
D සමාගම් වල ක්‍රියාකාරිත්වය රාජ්‍ය බල ප්‍රදේශය තුලට සීමාවේ
E පුද්ගල කැමැත්ත මත ඉවත් වීමට හැකියාව ඇත

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(14) සමාජ සම්මුතිවාදය,

A. මෙම මතවාදය ඉදිරිපත් කිරීමට හොබ්ස්, ලොක්, රූසෝ මුල්වූහ
B. මේ තුළින් එතෙක් පිළිගනු ලැබූ දේවවරම් වාදය ප්‍රතික්ශේප කරන ලදී
C. නව යුගය තුළ ගොඩනැගුණු රාජ්‍යය පිළිබඳ නව මතවාදයක් විය
D. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක වර්ධනයට මෙමගින් විශාල මෙහෙයක් සිදුවිය
E. බටහිර ඒකාධිපති පාලන ක්‍රමයට මෙහි අදහස් බලපෑවේය

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(15) ආණ්ඩුවක ව්‍යවස්ථාවකට අන්තර්ගත යුතු වන්නේ

A. ආණ්ඩුවේ ආයතනික ව්‍යුහය
B. අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල කාර්යභාරය
C. ආණ්ඩුව හා මහජනතාව අතර පැවතිය යුතු සබඳතාවන්හි ස්වරූපය
D. ආණ්ඩුක්‍රමය ඒකීය ද සන්ධීය ද යන වග
E. පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම්

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(16) අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A. ස්ථාවර බවකින් යුක්ත වේ
B. ව්‍යවස්ථාව සංශෝධනය කළයුතු ආකාරය කෙසේද යන්න ව්‍යවස්ථාවේ ම දක්වා ඇත
C. මෙවැනි ව්‍යවස්ථාවන්හි පුරවැසි අයිතිවාසිකම් වඩාත් හොඳින් ආරක්ෂාවේ
D. බොහෝ සන්ධීය රාජ්‍යයන්හි දක්නට ඇත
E. වෙනස්වන සමාජ තත්වයන්ට අනුව පහසුවෙන් වෙනස් කරගත හැකිවේ

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(17) මිනිසුන් දේශපාලනයට සහභාගිවන ක්‍රමෝපායයන් වන්නේ

A. මැතිවරණ
B. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම
C. බලපෑම් කාණ්ඩයම්
D. මහජන මතය
E. දේශපාලන විරුද්ධවාදීන් හා ගැටීම

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(18) ජනමත විචාරණය,

A. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයකි
B. ප්‍රජාතන්ත්‍රවාදී රටවල භාවිතයට ගැනේ
C. දේශපාලන වශයෙන් වැදගත් කරුණක් පිළිබඳ කැමැත්ත හෝ අකමැත්ත විමසනු ලබයි
D. මහජන නියෝජිතයින් තේරීම සඳහා ද යොදගත හැකිය
E. ව්‍යවස්ථාදයකයේ පරමාධිපත්‍ය බලයට හානි පමුණුවයි

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (..........)

**පහත දක්වා ඇත්තේ ජනාධිපති හා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම වලට අදල ප්‍රකාශ කිහිපයකි. මෙම ප්‍රකාශ පදනම් කරගෙන අංක (19) හා (20) ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. පුරවැසියන් විසින් නිශ්චිත කාලයක් සඳහා විධායකය ඍජුවම තෝරාගනු ලැබේ.
B. ඍජුව පත් කරන ව්‍යවස්ථාදයකය තුළින් විධායකය පත්වේ
C. කැබිනට් මණ්ඩලය විධායක බලතල බෙදගන්නා අතර එක්සත් භාවය උදෙසා සම්මුතීන්ට පැමිණේ
D. අගමැති තනතුර රාජ්‍ය නායකයාගේ තනතුරෙන් වෙන් කොට ඇත
E. දෙමුහුන් ජනාධිපති ක්‍රමයකදී හැරුණුවිට ජනාධිපතිවරයා විසින් විධායක බලතල තනිව භුක්ති විඳී
F. පත්වීමේ ක්‍රමය හේතු කොටගෙන විධායකය ඍජුවම ජනතාවට වගකීමට බැඳී සිටී

(19) ජනාධිපති ආණ්ඩුක්‍රමයට අදල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
1. ABC 2. BDE 3. CDE
4. AEF 5. ACD (..........)

(20) පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩු ක්‍රමයට අදාල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
1. ACF 2. BDE 3. BCD
4. BCF 5. DEF (..........)

**ව්‍යවස්ථාදායකයේ ඒක මණ්ඩල සහ ද්වි මණ්ඩල වාදයට අදාල ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ. එම ප්‍රකාශ යොද ගනිමින් අංක (21) සහ (22) ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A. බලය ඒක මණ්ඩලයක් තුළ ප්‍රධාන වශයෙන් රැඳී ඇත
B. කාර්යයන් හා වගකීම් පිළිබඳව අපැහැදිලිභාවයක් නොමැත
C. තවත් ආකාරයක සංවරණ හා තුලන ක්‍රමයක් සපයයි
D. වැඩ කටයුතු ප්‍රමානය අවම කළ හැකිය
E. බහුතර බලයක් හිමිවීම තුළින් ආඥාදයකත්වයෙන් යුතු පාලන ක්‍රමයක් ඇතිවිය හැක
F. විශිෂ්ටයින්ගේ සේවය ලබාගත හැකිය

(21) ඒක මණ්ඩලවාදයට අදල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
1. ABE 2. BDF 3. BCD
4. CDE 5. CEF (..........)

(22) ද්වි මණ්ඩලවාදයට අදල නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
1. ABF 2. CDF 3. BCF
4. CDE 5. DEF (..........)

Learning Resource Center R De Mazenod College Kandana

නියෝජිතයින් තේරීමට යොදාගන්නා ප්‍රධාන ක්‍රම දෙක හා ඒවාට අදාල ලක්‍ෂණ සමහරක් දක්වා ඇත. ඒ අනුව **(23)** හා **(24)** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. ආසන සංඛ්‍යාව, ලබන ඡන්ද සංඛ්‍යාව මත නිගමනය වේ
B. සැලකිය යුතු ඡන්දදායකයින් සංඛ්‍යාවකට කිසිදු නියෝජනයක් නොලැබේ
C. පක්ෂ නායකත්වයේ ග්‍රහණය අධික වේ
D. කුඩා පක්‍ෂ වලට අවාසි සහගතය
E. භූමියේ නියෝජනය කිරීම පිළිබඳ අදහස මත පදනම් වී ඇත
F. පක්‍ෂ නියෝජනය කිරීම පිළිබඳ අදහස මත පදනම් වී ඇත

(23) සමානුපාතික නියෝජන ක්‍රමයට අදල ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.
1. ACD 2. BCD 3. ACF
4. ABC 5. DEF (..........)

(24) සරල බහුතර නියෝජන ක්‍රමයට අදල ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.
1. BCD 2. DEF 3. CDE
4. BDE 5. ABE (..........)

(25) දේශපාලන පක්‍ෂ තුළ පොදුවේ දැකිය හැකි ලක්‍ෂණයන් අතරට නොගැලපෙන්නේ,
1. සහභාගීත්වය
2. බහුවිධතාව
3. රාජ්‍ය බලය අල්ලා ගැනීම් අරමුණ
4. ප්‍රතිපත්ති සම්පාදනයට දයක වීම
5. දැඩි ජාතිවාදය (..........)

අංක **(26) – (40)** තෙක් ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ පහෙන් එක් ප්‍රකාශයක් ප්‍රශ්නයේ මාතෘකාවට අදල නොවේ. අදල නොවන ප්‍රකාශය තෝරන්න.

(26) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ,
1. වැඩවසම් රාජ්‍ය යටත් විජිතයකට පරිවර්තනය විය
2. කෘෂි කර්මාන්තයේ වර්ධනයට පදනම දැමීය
3. විවෘත වෙළඳපොළ ක්‍රමය බිහිවිය
4. සේවයට බැඳ තැබීමේ සම්ප්‍රදයික ක්‍රම අහෝසි කරන ලදී
5. ආනයන – අපනයන හේතුවෙන් මිල මුදල් ආර්ථිකයක් ඇතිවුණි (..........)

(27) කෝල්බෲක් – කැමරන් යෝජනා යටතේ පිහිටවූ ආයතන වන්නේ
1. ශ්‍රේෂ්ඨාධිකරණය 2. ව්‍යවස්ථාදයක සභාව 3. අමාත්‍ය සභාව
4. විධායක සභාව 5. ආණ්ඩුකාරධූරය (..........)

(28) 1833 පිහිටුවන ලද ප්‍රතිසංස්කරණ හේතුකොටගෙන,
1. ස්වාධීන අධිකරණ ක්‍රමයක් බිහිවිය
2. දේශීය ධනපති පංතියක් පිහිවිය
3. වානිජ වතු වගාව බිහිවිය
4. ස්වදේශීය අධ්‍යාපනය දියුණු විය
5. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයකට පසුබිම ඇතිවිය (..........)

(29) 1910 ආණ්ඩුවේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය,
1. හඳුන්වා දුන්නේ 1910 නොවැම්බර් 24 දින නිකුත් කළ රාජාඥාවකිනි
2. ක්‍රියාවට නැංවූයේ 1912 දී ය
3. ව්‍යවස්ථාදායක සභාවේ නිලලත් හා නිල නොලත් සංඛ්‍යාවන් වැඩි කළේය
4. සීමිත ඡන්ද බලයක හිමිවීම ප්‍රථම වතාවට සිදුවිණි
5. ජාතීන් අනුව මන්ත්‍රීන් තේරීම තාවකාලිකව අත්හිටුවන ලදී (……….)

(30) 1920 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය,
1. ආණ්ඩුකරුට අවධාරිත බලතල ලබාදෙන ලදී
2. ප්‍රථම වතාවට නිල නොලත් මන්ත්‍රීන් වැඩි ගණනක් ව්‍යවස්ථාදායක සභාවට එක් කරන ලදී
3. ආණ්ඩුකාරතුමා විසින් නාමකරණයෙන් 07 දෙනෙකු ව්‍යවස්ථාදායක සභාවට පත්කරන ලදී.
4. ව්‍යවස්ථායක සභාවේ නිල කාලය වසර හතරකට සීමා කරන ලදී
5. ව්‍යවස්ථාදායකයේ මුලසුන ආණ්ඩුකරුට හිමිකරන ලදී (……….)

(31) 1924 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය,
1. ආණ්ඩුකරු විසින් නාමකරණයෙන් ව්‍යවස්ථාදායකයට හය දෙනෙකු පත් කළේය
2. ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය ප්‍රසාරණය කළේය
3. බලය හා වගකීම එකිනෙකින් වෙන්කර තැබීය
4. සීමිත ඡන්ද බලයේ පුළුල් වෙනසක් සිදු නොකළේය
5. විධායක සභාව තවදුරටත් පවත්වාගෙන යාමට කටයුතු කළේය (……….)

(32) ලංකාවේ ජාතික ව්‍යාපාරය
1. බහුජන ව්‍යාපාරයක් නොවීය
2. සටන්කාමී ජනතා ව්‍යාපාරයක් විය
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා වූ ව්‍යාපාරයක් විය
4. ලාංකිකයන්ට වඩාත් වගකීම් සහිත ආණ්ඩු ලබා ගැනීම සඳහා වූ ව්‍යාපාරයක් විය
5. බටහිරකරණය වූ සමාජ ප්‍රභූන්ගේ නායකත්වයෙන් යුතු ව්‍යාපාරයක් විය (……….)

(33) ශ්‍රී ලංකාවේ පුනර්ජීවන ව්‍යාපාරය,
1. ආගම, යටත් විජිත විරෝධී මාධ්‍ය කරගත් ව්‍යාපාරයක් විය
2. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ සමාජ ව්‍යාපාර ඇසුරෙන් හඳුනා ගැනීම සිදුකළ යුතුය
3. බෞද්ධ, හින්දු, ඉස්ලාම් යන ආගම් මුල් කරගෙන ගොඩනැගුණි
4. දේශීය ආගම් සියල්ල සමගිව සිදුකරගෙන ගිය ව්‍යාපාරයකි
5. ජාතික ව්‍යාපාරය බිහි කිරීමට අවශ්‍ය පසුබිම සකසන ලද ව්‍යාපාරයකි (……….)

(34) යටත්විජිත ශ්‍රී ලංකාවේ මධ්‍යම පන්තිය
1. යටත්විජිත ආර්ථිකයෙන් සහ අධ්‍යාපනයෙන් පෝෂණය ලැබුවෝ වූහ
2. සමාජ ව්‍යාපාරයන් ගොඩනැගීමේදී සාමාන්‍ය ජනයාට නායකත්වය ලබා නොදුන්නේය
3. බ්‍රිතාන්‍යයන් සමග සම්මුතිවාදී ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීම තුළින් තම අරමුණු දිනාගත හැකි බව පිළිගත්තෝය
4. වාර්ගික පදනම මත බෙදී වෙන්වී සිටි බැවින් ශක්තිමත් ජාතික ව්‍යාපාරයක් බිහි කිරීමට තිබූ අවස්ථාව අහිමි කර ගත්තේය
5. සාමාන්‍ය ජනතාව සමග ප්‍රසිද්ධියේ දේශපාලන ප්‍රශ්න සාකච්ඡා කරමින් ඔවුන් දේශපාලනය වෙත ගෙන ඒමට උනන්දුවක් දක්වීය (……….)

(35) ලංකා ජාතික සංගමය,

1. 1919 දෙසැම්බර් මාසයේදී පිහිටුවන ලදී
2. නිදහස් ව්‍යාපාරයට නායකත්වය සපයන ලදී
3. යටත්විජිත පාලනයෙන් නිදහස ලබා ගැනීම සඳහා ඉන්දියානු ක්‍රමය අනුගමනය කරන ලදී
4. සාමාජිකත්වය ප්‍රධාන වශයෙන් ප්‍රභූන්ට පමණක් සීමා කරන ලදී
5. ආරම්භක සහභාගීත්වය සර් පොන්නම්බලම් අරුණාචලම්ට පවරන ලදී (..........)

(36) ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය පැන නැගීම කෙරෙහි බලපෑ හේතු

1. 1930 ගණන්වල ග්‍රාමීය පෙදෙස්වල වර්ධනය වූ ගොවි අරගල
2. 1930 ගණන් වල ඇතිවූ ලෝක ආර්ථික අර්බුදය
3. මාක්ස් හා ලෙනින් ගේ විප්ලවකාරි දේශපාලන අදහස් වල බලපෑම
4. 1930 ගණන් වල ඉස්මතු වූ රැඩිකල් තරුණ ව්‍යාපාරයේ බලපෑම
5. සමාජවාදි සමාජයක් බිහිකිරීමේ අරමුණ (..........)

(37) "සූරිය මල් ව්‍යාපාරය",

1. පොපිමල් ව්‍යාපාරයට එරෙහිව ආරම්භ කළ විරෝධතා ව්‍යාපාරයක් විය
2. ඒලියන් පෙරේරා මෙම ව්‍යාපාරයේ නිර්මාතෘ විය
3. 1930 ගණන් වල ආරම්භයේදී ජනයා අතර අධිරාජ්‍ය විරෝධි නැගීම් උද්දීපනය කිරීමට දායක විය
4. ලංකා ජාතික සංගමයේ නායකයින් විසින් මෙහෙයවන ලදී
5. ලංකා සම සමාජ පක්ෂය පිහිටුවීමේ ක්‍රියාදමයේ ආරම්භක පියවරක් විය (..........)

(38) ලංකා සම සමාජ පක්ෂයේ ආරම්භක අරමුණු,

1. යටත් විජිත පාලනයෙන් පූර්ණ නිදහස දිනා ගැනීම
2. ජාතිය, කුලය, ආගම, ස්ත්‍රී - පුරුෂ භේද මත පවතින විෂමතා තුරන් කිරීම
3. සෑම ආකාරයම නිෂ්පාදන බෙද හැරීමේ හා හුවමාරු කිරීමේ මාර්ග ජනසතු කිරීම
4. වැඩ කරන ජනතාවගේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
5. ලංකා ජාතික සංගමයට එරහිව නාගරික කම්කරු පන්තිය සංවිධානය කිරීම (..........)

(39) අමද්‍යප ව්‍යාපාරය,

1. 1912 මැයි 31 සුරාබදු පනතට එරෙහිව පැන නැගුණු ව්‍යාපාරයක් විය
2. මෙම ව්‍යාපාරයේ පියා ලෙස සැලකෙන්නේ ආතර් වී. දියෙස් මහතා ය
3. මූලික අරමුණ වූයේ මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳ ජනතාව දැනුවත් කිරීමයි
4. ජාතික ව්‍යාපාරයේ රැඩිකල් පිළ සමග එක්ව කටයුතු කළේය
5. මෙය සිංහල බෞද්ධයින් විසින් මෙහෙයවන ලද සමාජ ව්‍යාපාරයක් විය (..........)

(40) ලංකා කම්කරු සංගමය,

1. ඒ.ඊ. ගුණසිංහ මහතා විසින් නායකත්වය සපයන ලදී
2. 1920 ගණන් වලදී නාගරික කම්කරුවන් සංවිධානය කළේය
3. ලංකා ජාතික සංගමයේ වෘත්තීය සමිති හස්තය විය
4. වාමාංශයට නැඹුරු වූ කම්කරු ජාතික සංවිධානයක් විය
5. සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමට උපස්ථම්භක විය (..........)

**අංක (40) සිට (50) දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා තිබෙන ප්‍රකාශ අතුරෙන් මාතෘකාවට ගැළපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

(41) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය,

A. 1833 සිට පැවති විධායක සභාව අහෝසි කළේය
B. ලාංකිකයින්ට $\frac{7}{10}$ ක විධායක බලතල පැවරිය
C. වාර්ගික නියෝජනය අහෝසි කළේය
D. සර්වජන ඡන්ද බලය ප්‍රදානය කළේය
E. නාමකරණයෙන් මන්ත්‍රීන් තේරීම අහෝසි කළේය

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (..........)

(42) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය නිලධාරීන් තිදෙනා

A. ව්‍යවස්ථාවේ මුර බල්ලන් ලෙස සලකන ලදී
B. මුදල්, පරිපාලන සහ නීති යන අමාත්‍යාංශ භාර කටයුතු කරන ලදී
C. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී
D. අනෙකුත් කාරක සභාවල කටයුතු වලට බලපෑම් කරන ලදී
E. ඔවුන් ඉවත් කිරීමේ බලයක් මන්ත්‍රණ සභාවට නොතිබුණි

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (..........)

(43) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාව,

A. ආණ්ඩුකරු විසින් මුලසුන දරන ලදී
B. සාමාජිකයින් 61 දෙනෙකුගෙන් සමන්විත විය
C. ව්‍යවස්ථාදායක විධායක කාර්යයන් දෙකම භුක්ති වින්දේය
D. නීති සම්පාදනය සම්බන්ධයෙන් ස්වාධිපති ආයතනයක් නොවීය
E. ඡන්ද කොට්ඨාශ පදනමින් තෝරාගත් සාමාජිකයින් 50 දෙනෙකුගෙන් යුක්ත විය

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (..........)

(44) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයාට පනත් සම්බන්ධයෙන් තිබූ බලතල

A. පනතට අනුමැතිය දීම
B. පනතට අනුමැතිය නොදීම
C. මහරජුගේ කැමැත්ත විසමත තෙක් අනුමැතිය දීම කල් තැබීම
D. පනත් නීතිගත කිරීම සඳහා කතානායක වෙත යොමු කිරීම
E. අනුමැතිය දී පනත ක්‍රියාවට නැංවීමට මාස 06 කට නොවැඩි කාලයකට කල් තැබීම

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (..........)

12 ශ්‍රේණිය 2016 . 04 . 07
දේශපාලන විද්‍යාව



Learning Resource Center
R
De Mazenod College
Kandana

(45) ඩොනමෝර් ආණ්ඩුකරුට නිශේධ බලය යෙදවිය හැකි පනත්,

A. රාජ්‍ය සේවය හා සම්බන්ධ පනත්
B. රටේ මූල්‍ය තත්වයට බලපාන පනත්
C. අභ්‍යන්තර වෙළඳාමට බලපාන පනත්
D. සුළු ජන කොටස්වල විරෝධයට පාත්‍රවන පනත්
E. අධිරාජ්‍ය වැඩ කටයුතු හා සම්බන්ධ පනත්

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(46) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය සමස්තයක් ලෙස,

A. ලාංකිකයන්ට සැලකිය යුතු ප්‍රමාණයක විධායක බලය හා වගකීම් පැවරීය
B. ලාංකිකයන්ට ස්වයං පාලනය පිළිබඳ පුහුණුව සැපයීය
C. සාමාන්‍ය ජනතාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනය කළේය
D. සමාජවාදී සමාජයකට පසුබිම සැකසීය
E. ජනතා සුභ සිද්ධියට අදාල ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබීය

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(47) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A. ලංකාවට ඩොමීනියන් තත්වය ප්‍රදානය කරන ලදී
B. බ්‍රිතාන්‍ය රජින රාජ්‍ය නායකයා ලෙස තවදුරටත් රඳවනු ලැබීය
C. කැබිනට් ආණ්ඩුකමය හඳුන්වා දෙන ලදී
D. රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලය හඳුන්වා දෙන ලදී
E. දෙවන මණ්ඩල ක්‍රමයක් හඳුන්වා දෙන ලදී

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(48) 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් මණ්ඩලය

A. පත්කරනු ලැබුයේ අග්‍රාණ්ඩුකරු විසිනි
B. සමන්විත වූයේ අගමැති සහ අමාත්‍යවරුන් ගෙන්
C. ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදනයේ පුරෝගාමීන් වූහ
D. විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කිරීමට හැකිවිය
E. පාර්ලිමේන්තුවට වග නොකීය

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

(49) සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ පාර්ලිමේන්තුව

A. ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයක් විය
B. සුළු ජන නියෝජනයට හිමිකම් පෑහ
C. වසර හතරක නිල කාලයකට යටත් වූහ
D. කථානායකවරයාගේ මූලිකත්වයෙන් රැස්විය
E. සරල බහුතර නියෝජන ක්‍රමය තුළින් මහජන නියෝජිතයින් පත්වූහ

1. ABCD 2. BCDE 3. ABDE
4. ACDE 5. ABCE (.........)

# දේශපාලන විද්‍යාව

## 11 කොටස 12 ශ්‍රේණිය

2016 - April

## A කොටස

1. "දේශපාලන විද්‍යාව විද්‍යාත්මකව අධ්‍යනය කල නොහැකි බව පොදුවේ පිළිගත් මතයක් වන්නේය " මෙම මතය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති තර්ක දෙකක් දක්වන්න .
2. රාජ්‍ය ,සමාජයෙන් වෙනස් වන සාධක දෙකක් දක්වන්න .
3. මිනිසුන් නීතියට යටත් වන්නේ ඇයි ?
4. කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකය කොටස් දෙකකින් සමන්විත වේ .එම කොටස් දෙක නම් කරන්න .
5. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා මාර්ග කොටස් දෙකකට බෙදනු ලැබේ .එම කොටස් දෙක සඳහන් කරන්න .
6. ආණ්ඩුව කොටස් දෙකකට වර්ග කර දක්වන්න .
7. නව රාජයක ලක්ෂණ දෙකක් දක්වන්න .
8. රාජ්‍ය විකාශන අවධි දෙකක් සඳහන් කරන්න .
9. ඒකීය රාජ්‍යයක යහපත් ලක්ෂණ දෙකක් දක්වන්න .
10. පුරවැසිකම ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වන්න .
11. කොල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි 1833 ස්ථාපිත කල ව්‍යවස්ථාදායක සභාව සමන්විත වූයේ දෙවර්ගයක නියෝජිතයන් ගෙනි ." එම දෙවර්ගය සඳහන් කොට ඒ ඒ වර්ගයට අයත්වූ අමාත්‍ය වරුන්ගේ ගණන දක්වන්න.
12. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය තුල 19 වන සියවස අගභාගයේදී ශ්‍රී ලංකාවේ පැනනැගුනු සමාජ ව්‍යාපාර දෙකක් නම් කරන්න .
13. 1920 මැනිං ප්‍රතිසංස්කරණයේ නිලලත් හා නිලනොලත් සාමාජික සංඛ්‍යාව දක්වන්න.
14. ලංකා ජාතික සංගමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
15. වාමාංශික ව්‍යාපාරය දුර්වල වීම කෙරෙහි බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.
16. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ විධයක කාරක සභාවන්හි යහපත් ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
17. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ යහපත් ලක්ෂණ දෙකක් දක්වන්න .
18. සෝල්බරි ආනඩුක්‍රමයේ ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙක සඳහන් කර එහි සංඛ්‍යාව සඳහන් කරන්න.
19. 19වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇති කල විශේෂ වෙනස්කමක් සඳහන් කරන්න.
20. නව ව්‍යවස්ථාවක් පැනවීම සඳහා නූතනයේ ඒ සඳහා ඇතිකළ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය කුමක්ද?

7.04.2016
දේශපාලන විද්‍යාව

Learning Resource Center
R
... College
Kandana

## B කොටස

<u>ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න .</u>

1. පහත සඳහන් ඒවායින් දෙකකට පිළිතුරු සපයන්න.

    i. මිනිසුන් දේශපාලන විද්‍යාව ඉගෙනගන්නා මාර්ග මොනවාදැයි දක්වා චර්යාවාදී අධ්‍යයන ක්‍රමය පැහැදිලි කරන්න .

    ii. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය කෙටියෙන් පැහැදිලි කරන්න .

    iii. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න .

    iv. සමාජවාදී හා ලිබරල්වාදී රාජ්‍යයක පුද්ගලයාගේ තත්වය විමසන්න .

    v. රාජ්‍යය හා අනෙකුත් සමාජ සංවිධාන අතර වෙනස පැහැදිලි කරන්න

2. පහත සඳහන් රාජ්‍ය සංකල්ප <u>2ක් පමණක්</u> පැහැදිලි කරන්න

    i. නිර්බාධාවාදී රාජ්‍ය ක්‍රමය

    ii. සුබසාධනවාදී රාජ්‍ය ක්‍රමය

    iii. අවම රාජ්‍ය ක්‍රමය

    iv. නව රාජ්‍ය ක්‍රමය

3. කරුණු <u>දෙකක් පමණක්</u>. විමසන්න

    i. ආණ්ඩුවක කාර්යභාරය විමසන්න

    ii. ව්‍යවස්ථාකූලවාදය පැහැදිලි කරන්න .

    iii. ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම පැහැදිලි කරන්න.

    iv. පෙතිවාසිකම් නිර්වචනය කරන්න

    v. ජනාධිපති හා කැබිනට් ආන්ඩු ක්‍රම වල වාසි හා අවාසි විමසන්න .

4. අත්තනෝමතික හා ඒකාධිපති පාලනයක් වැළැක්වීමේ මාර්ගයක් ලෙස බලතල බෙදීමේ න්‍යායේ වැදගත්කම පැහැදිලි කරන්න .

## C කොටස

<u>ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න</u> .

1. කොල්බෲක් නිර්දේශ දක්වා එමගින් ඇතිවූ සමාජ හා ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න .
2. ජාතික ව්‍යාපාරය හා වාමාංශික ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු දක්වා ඒවායේ ක්‍රියාකාරිත්වය සංසන්දනාත්මකව විමසන්න .
3. ඩොනමෝර් ආන්ඩුකමයේ යහපත් හා අයහපත් ප්‍රතිවිපාක දක්වන්න
4. සෝල්බරි ආන්ඩුකමයේ ව්‍යවස්ථාදායකය හා විධායකය පැහැදිලි කරන්න .